රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 16/2013

මගේ අංකය : EST-7/LEAVE/03/3451
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2013.08.10

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**අන්තර් ජාතික/බහු පාර්ශවීය ආයතනවල තනතුරුවලට ශ්‍රී ලංකා රජය විසින් නාම යෝජනා කරන ලදුව පත් කෙරෙන රාජ්‍ය නිලධාරීන්ට නිවාඩු ලබාදීම - ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදය**

ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. ශ්‍රී ලංකා රජය සාමාජිකත්වය දරන අන්තර් ජාතික/බහු පාර්ශවීය ආයතනයක තනතුරක් සඳහා ශ්‍රී ලංකා රජය විසින් නාම යෝජනා කරන ලදුව පත්වන රාජ්‍ය නිලධරයෙකුට එම තනතුර දරන කාලය සඳහා වැටුප් රහිත නිවාඩු ලබා දීමට 2013.05.09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

03. ඒ අනුව ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයට 38 වෙනි වගන්තිය වශයෙන් පහත වගන්තිය ඇතුළත් කරමින් සංශෝධනය කරනු ලැබේ.

38. ශ්‍රී ලංකා රජය සාමාජිකත්වය දරන අන්තර් ජාතික/බහු පාර්ශවීය ආයතනයක තනතුරක් සඳහා ශ්‍රී ලංකා රජය විසින් නාම යෝජනා කරන ලදුව පත්වන රාජ්‍ය නිලධරයෙකුට එම තනතුර දරන කාලය සඳහා වැටුප් රහිත නිවාඩු ලබාදීම.

38:1 එබඳු තනතුරක රාජ්‍ය නිලධරයෙකුට සේවය කළ හැකි උපරිම කාලය වසර පහකි.

38:2 ඉහත සඳහන් නිවාඩු කාලය නිලධාරියාගේ සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතු අතර ඔහුගේ ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුප් ගණනය කිරීමට බාධාවක් නොවිය යුතුය.

04. මෙම විධිවිධාන 2013.01.01 දින සිට බලාත්මක වේ.

පී.බී අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය